# ඇබෑර්තු

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## අරමුදල් ප්‍රභවය : ලෝක බැංකුව

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) ලෝක බැංකුව විසින් අරමුදල් ප්‍රතිපාදිත කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතියකි.

2019.03.15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 01/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව සහ රජයේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය අනුව පහත තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත පූර්ණකාලීන සේවය සඳහා ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | PS කාණ්ඩය | තනතුරු ගණන |
|---|---|---|---|
| 1 | අධීක්ෂණ සහ ඇගයීම් විශේෂඥ | PS 3 | 1 |
| 2 | සන්නිවේදන නිලධාරී | PS 4B | 1 |
| 3 | ඉංජිනේරු (ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පිළිබඳ පළපුරුද්ද විශේෂිත වේ) | PS 4B | 1 |

ඉහත තනතුරු (අංක 1 සිට 3 දක්වා) සඳහා වැටුප් අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛයේ 03 වන වගුවෙහි 03 වන තීරුවේ සඳහන් කොට ඇති අතර මූලික සුදුසුකම් සහ අවශ්‍ය පළපුරුද්ද එම චක්‍රලේඛයෙහිම 1 වන ඇමුණුමෙහි 3 වන වගුවේ දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| 4 | කළමනාකරණ සහකාර | - | 2 |

### රැකියා විස්තරය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සහය වීම, ව්‍යාපෘති ලිපිගොනු සහ වාර්තා පවත්වාගෙන යාම මූල්‍ය ප්‍රසම්පාදන සහ අනෙකුත් ව්‍යාපෘති ලේඛන සකස් කිරීම/ පරීක්ෂා කිරීම

**හෝ**

ප්‍රවාහන කටයුතු කළමනාකරණය, වාහන නඩත්තු කාලසටහන් සකස් කිරීම, ප්‍රවාහන කටයුතු සඳහා රියදුරු සම්බන්ධීකරණය සහ ප්‍රවාහන නීති හා ප්‍රතිපත්ති පිළිපැදීමෙන් ව්‍යාපෘති සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම, සහතික කිරීම මගින් ව්‍යාපෘති ප්‍රවාහන මෙහෙයුම් අධීක්ෂණය කිරීම.

### සුදුසුකම් අවශ්‍යතා

එක් වරකදී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා, ගණිතය සහ තවත් විෂයන් දෙකක් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබීම සහ එක්වරකදී අ.පො.ස (උ.පෙ) විභාගය සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයන් තුනකින් සමත් වීම මේ සඳහා ප්‍රමාණවත් වේ) සහ ඉංග්‍රීසි භාෂාවෙහි සහ පරිගණක සාක්ෂරතාවයෙහි ප්‍රවීණත්වයක් ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ. ප්‍රසම්පාදන/ ප්‍රවාහන පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

| | | | |
|---|---|---|---|
| 5 | කාර්යාල කාර්යය සහයක | - | 1 |

### රැකියා විස්තරය සහ සුදුසුකම් අවශ්‍යතා :

ලිපිගොනු සැකසීම, ලිපි ලේඛන පවත්වාගෙන ගැනීම සහ කාර්යාලයෙහි එදිනෙදා කටයුතු සඳහා නිලධාරීන්ට සහය වීම ඇතුළුව සාමාන්‍ය කාර්යාලීය සහය සේවාවන් සහ ලිපිකරු රාජකාරී ඉටු කිරීම.

සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයන් පහකින් (05) සමත් වී තිබීම.

### පොදු කොන්දේසි

1. අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩුවිය යුතුය.
2. වැටුප් පරිමාණය : රජයේ අනුමත වැටුප් පරිමාණයන් සමග කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) අංක 01/2019 හා 15-03-2019 දතම දරන චක්‍රලේඛය සහ ඉන්පසු සිදුවූ වෙන යම් සංශෝධන පරිදි දීමනා.
3. රැකියා කොන්ත්‍රාත්තුව වසරක් වන අතර කාර්ය සාධනය හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත පදනම්ව වාර්ෂිකව නැවත සේවා කාලය දීර්ඝ කරනු ලැබේ.
4. තෝරාගත් අයදුම්කරු අදාළ රජයේ ආයතන සහ අනෙකුත් නියෝජිතායතන හා සමග සම්බන්ධීකරණයෙන් තම රාජකාරී ඉටු කළ යුතුය.
5. ශ්‍රී ලංකාව තුළ ලෝක බැංකු/ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල වැඩ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.
6. අවශ්‍ය අවස්ථාවන්හිදී දිගු වේලාවන් හා සති අන්තයන්හි සේවය කිරීමට ඇති හැකියාව.
7. තම වෘත්තීය ජීවිතය පුරා උසස් නිලධාරීන් සමග යහපත් හැසිරීම හා වෘත්තීය සබඳතා පිළිබඳ සතුට කළ වාර්තාවක් අවශ්‍යවේ.
8. තරුණ, උද්යෝගිමත් හා කඩිසර අයදුම්කරුවන් අයදුම් කිරීම සඳහා දිරිගැන්වේ.

තම සම්පූර්ණ ජීව දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සහ අධ්‍යාපන සහ වෘත්තීය සහතික හි සහතික කළ පිටපත් සහිත අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට 2026 ජනවාරි 23 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් ඇතුළු රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.

ඊට අතිරේකව, අයදුම්පතෙහි පිටපතක්, අයදුම් කරනු ලබන තනතුර ඊ මේල් ශීර්ෂ තීරුවෙහි සඳහන් කරමින් **ao.iwwrmp@gmail.com** වෙත එවන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයක් මත පදනම්ව සිදු කෙරෙන අතර, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. කුමන ආකාරයක හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලබන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP),**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක.96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**දුරකථන : 0112-691163**
**වෙබ් අඩවිය : www.iwwrmp.lk**